*සියලුම හිමිකම් ඇවිරිණි.*
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - I** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කරනු ලබන්නේ,
    (1) මැතිවරණ දෙපාර්තමේන්තුව මගිනි. (2) ශ්‍රේෂ්ඨාධිකරණය මගිනි.
    (3) මැතිවරණ කොට්ඨාස මගිනි. (4) සීමා නිර්ණය කොමිෂන් සභාව මගිනි.

02. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමේ දී දැකිය හැකි ලක්ෂණයක් පහත පිළිතුරු අතුරෙන් තෝරන්න.
    (1) ප්‍රජා අයිතිය නොමැති අයට පවා ඡන්දය දීමට ඉඩ සැලසිය යුතුය.
    (2) නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්විය යුතුය.
    (3) රටේ සියලුම ජනතාවට ඡන්දය දීමට ඉඩ දිය යුතුය.
    (4) නියෝජිතයින් ගේ කැමැත්ත අනුව ඡන්දය පැවැත්විය යුතුය.

03. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රදේශීය පාලන ඒකක වෙත පවරාදීම හඳුන්වන්නේ,
    (1) බලය පවරා දීම යනුවෙනි. (2) බලය විමධ්‍යගත කිරීම යනුවෙනි.
    (3) බලය බෙදීම යනුවෙනි. (4) බලය විතැන් කිරීම යනුවෙනි.

04. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක විධායක බලතල ක්‍රියාවට නංවනු ලබන්නේ,
    (1) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය මගිනි. (2) ජනාධිපති සහ අමාත්‍ය මණ්ඩලය මගිනි.
    (3) අගමැති හා නාමික විධායකය මගිනි. (4) අගමැති හා රටක ස්ථිර විධායකය මගිනි.

05. පළාත් ආණ්ඩුකාරවරයා සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි පිළිතුර තෝරන්න.
    (1) පළාත් ආණ්ඩුකාරවරයා පත් කරන්නේ මහ ඇමති විසිනි.
    (2) නිල කාලය වසර 04 කි.
    (3) මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වේ.
    (4) පළාතේ ප්‍රධාන විධායකය වේ.

- **පහත සඳහන් ප්‍රකාශ උපයෝගී කරගෙන 05 සහ 06 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A ආණ්ඩුව සතු තිවිධ බලතල එක් මධ්‍යම ආණ්ඩුවක් මගින් ක්‍රියාවට නැංවීම.
B ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම.
C භූමි ප්‍රමාණය විශාල රාජ්‍යවල පරිපාලන තීන්දු ගැනීමට පහසු වීම.
D මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය මගින් සම්මත කරන පනතකින් පමණක් පරිපාලන බලය විමධ්‍යගත කිරීම.
E මධ්‍යම ආණ්ඩුවේ අත්තනෝමතික ක්‍රියාවන් වැළක්වීමට පහසුවීම.
F විමධ්‍යගත කරන බලතල නැවත ආපසු මධ්‍යම ආණ්ඩුවට පවරා ගත හැකි වීම.

06. ඒකීය ආණ්ඩු ක්‍රමයට දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුරු තොරතුරන්න.
    (1) ABC (2) ACD (3) ADE (4) ADF

07. සන්ධීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) ACE (2) BCE (3) CDE (4) BEF



*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

08. ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) විධායක බලතල ක්‍රියාවට නංවන්නේ ජනාධිපති ධූරය විසිනි.
   (2) ජනපද 26 න් ආරම්භ වූවකි.
   (3) ව්‍යවස්ථාදායකය සන්ධීය මහා මණ්ඩලය නමින් හැඳින්වේ.
   (4) ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කොට ඉතිරි බලතල මධ්‍යම ආණ්ඩුවට ලබා දී ඇත.

09. පළාත් පාලන ආයතන ප්‍රකාශයට පත් කිරීම එයට නමක් නියම කිරීමේ කාර්යය පැවරෙන්නේ,
   (1) මැතිවරණ කොමසාරිස්ටය. (2) සීමා නිර්ණය කොමිසමටය.
   (3) විෂය භාර අමාත්‍යවරයාටය. (4) ජනාධිපතිටය.

10. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යුහය තුළ නගර සභාවක් දක්නට නොලැබෙන පළාත වන්නේ,
   (1) උතුරු පළාතය. (2) දකුණු පළාතය.
   (3) වයඹ පළාතය. (4) උතුරු මැද පළාතටය.

11. සර්වජන ඡන්ද බලය විධායක කාරක සභා ක්‍රමය, පළාත් බද නියෝජනය වැනි ප්‍රගතිශීලී යෝජනා රැසක් ක්‍රියාත්මක කරන ලද ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?
   (1) කෝල්බෲක් ප්‍රතිසංස්කරණය. (2) කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය.
   (3) මැනිං ප්‍රතිසංස්කරණය. (4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය.

12. පළාත් සභා සම්බන්ධයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ,
   (1) ප්‍රධාන අමාත්‍යවරයා හා අමාත්‍යවරු සිව් දෙනෙකුට නොවැඩි පිරිසකගෙන් සමන්විත වේ.
   (2) ප්‍රධාන අමාත්‍යවරයෙකු හා අමාත්‍යවරු පස් දෙනෙකු නොවැඩි පිරිසකගෙන් සමන්විත වේ.
   (3) ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරු සිව් දෙනෙකුගෙන් සමන්විත වේ.
   (4) ප්‍රධාන අමාත්‍යවරයා හා අනෙකුත් අමාත්‍යවරු එක් එක් පළාත්සභා අනුව වෙනස් වේ.

13. පහත ''අ'' කොටසේ ඇති සිදුවීම් ''ආ'' කොටසේ ඇති වර්ෂයන් සමග ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| | අ | | ආ |
|---|---|---|---|
| i. | ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුවක් හඳුන්වා දීම. | A. | 1972 |
| ii. | ඩොමිනියන් තත්වය අහෝසි කර ස්වාධින ජනරජයක් බවට පත් කිරීම | B. | 1978 |
| iii. | විධායක බලය සහිත ජනාධිපති ධූරයක් ඇති කිරීම. | C. | 1947 |

   (1) ABC (2) CAB (3) BCA (4) CBA

14. මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ප්‍රථමවරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද්දේ කුමන ව්‍යවස්ථාවෙන් ද?
   (1) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ය. (2) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ය.
   (3) 1947 සෝල්බරි ව්‍යවස්ථාවේ ය. (4) 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ය.

15. ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජ පවතින රටවලට නිදසුන් වන්නේ,
   (1) ශ්‍රී ලංකාව හා ප්‍රංශයයි. (2) ශ්‍රී ලංකාව හා ඉන්දියාවයි.
   (3) ඉන්දියාව හා ඇමරිකා එක්සත් ජනපදයයි. (4) ඉන්දියාව හා ප්‍රංශයයි.

16. ලෝකයේ බොහෝ සංවර්ධිත රටවල් ආර්ථික, සමාජීය හා දේශපාලනික ක්‍රියාවලියේ දී බහු සංස්කෘතිකභාවය හොඳින් ප්‍රයෝජනයට ගෙන තිබෙන අතර ඔවුන්ගේ තේමාව වන්නේ,
   (1) ''එක් රාජ්‍යයකට එක් ජාතියක්'' යන්නයි. (2) ''හැඩ ගැස්ම හෙවත් හැදියාව'' යන්නයි.
   (3) ''ශක්තිමත් දේශයක්'' යන්නයි. (4) වෙනස්කම් තුළින් එකමුතු බව'' යන්නයි.

17. මිනිසාගේ මූලික අවශ්‍යතාවයන් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ආහාර, නිවාස, ඉඩම් වේ. (2) ආහාර, ඇඳුම් පැළඳුම් වේ.
   (3) ආහාර, මුදල්, නිවාස වේ (4) ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් වේ.

18. නිෂ්පාදනය කළ යුතු භාණ්ඩය කොපමණ නිෂ්පාදනය කරන්නේ ද යන ප්‍රශ්නය විසඳා ගැනීමෙන් පසුව ඊළගට මුහුණ දීමට සිදුවන ආර්ථික ප්‍රශ්නය වන්නේ,
   (1) කෙසේ නිෂ්පාදනය කරන්නේ යන්නයි.
   (2) කුමක් නිෂ්පාදනය කරන්නේ ද යන්නයි.
   (3) කුමන අංශයක් නිෂ්පාදනය කරන්නේ ද යන්නයි.
   (4) කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද යන්නයි.

19. පහත ''අ'' තීරුවේ සඳහන් නිෂ්පාදන සාධක සමග ''ආ'' තීරුවේ ඇති ඒවාට කරන ගෙවීම් නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | භූමිය | A | පොලිය |
| 2. | ශ්‍රමය | B | ලාභ |
| 3. | ප්‍රාග්ධනය | C | බදු කුලිය |
| 4. | ව්‍යවසායකත්වය | D | වැටුප් |

(1) ABCD (2) CABD (3) CDAB (4) BCDA

20. දේපල අයිතිය පෞද්ගලික අංශය සතු සහ ඒවා ලාභ අපේක්ෂාවෙන් ආර්ථික කටයුතු මෙහෙයවන ආර්ථික සංවිධානය හැඳින්වෙන්නේ,
(1) සමාජවාදී අර්ථ ක්‍රමය යනුවෙනි. (2) ධනවාදී අර්ථ ක්‍රමය යනුවෙනි.
(3) මිශ්‍ර අර්ථ ක්‍රමය යනුවෙනි. (4) වෙළඳපොළ අර්ථ ක්‍රමය යනුවෙනි.

21. ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) වැඩ ලෝකය සීමා වීම.
(2) ගෝලීය වෙළඳපොල පටු වීම.
(3) ලෝකයේ ඕනෑම රටක ජීවත්වීමට හැකිවීම.
(4) අඩු මිලට ශ්‍රමය ලබාගත හැකි රටවලට කාර්මාන්ත සංක්‍රමණය වීම.

22. වෙළඳපොළ ආර්ථිකයන්හි සමාජවාදී සැලසුම්ගත ලක්ෂණ ඇතුළත් රටකට නිදසුනක් පහත පිළිතුරු වලින් තෝරන්න.
(1) සිංගප්පූරුව (2) කියුබාව (3) ඕස්ට්‍රේලියාව (4) රුසියාව

23. ජාතික මට්ටමින් නැතහොත් පුළුල් මට්ටමින් පවතින ගැටුම්කාරී තත්වයන්
(1) වාර්ගික ගැටුම් ලෙස හැඳින්වේ. (2) සූක්ෂම ගැටුම් ලෙස හැඳින්වේ.
(3) අන්තර්ජාතික ගැටුම් ලෙස හැඳින්වේ. (4) සාර්ව ගැටුම් ලෙස හැඳින්වේ.

24. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ,
(1) ජොහාන් ගැල්ටුන් විසිනි. (2) මහාචාර්ය ගානර් විසිනි.
(3) හර්මන් ජේ ෆයිනර් විසිනි. (4) ජෙරමි බෙන්තම් විසිනි.

25. ගැටුම් නිරාකරණයේ දී පුද්ගල ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න.
A දරාගැනීමේ ශක්තිය. B අන් අයට ගරු කිරීම.
C ඵලදායී තීරණ ගැනීම. D යුතුකම් ඉටුකිරීම.
(1) AB (2) AC (3) AD (4) BD

26. යම්කිසි රාජ්‍යයක මූලික නීතය වන්නේ මින් කුමක් ද?
(1) සිවිල් නීතිය. (2) පාර්ලිමේන්තු නීතිය.
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය. (4) අපරාධ නීතිය.

27. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) නීතිය නොදැන සිටීම නිදහසට කරුණකි.
(2) රටක සියලු ජනතාව නීතියට යටත්ය.
(3) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ රෝම ලන්දේසි නීතියයි.
(4) නීතිය හා බැඳුනු අනෙක් සංකල්පය වන්නේ යුක්තියයි.

28. ශ්‍රී ලංකාවේ අධිකරණය පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ඉහළම අධිකරණ ආයතනය කුමක් ද?
(1) අභියාචනාධිකරණයයි. (2) මහාධිකරණයයි.
(3) මහේස්ත්‍රාත් අධිකරණයයි. (4) ශ්‍රේෂ්ඨාධිකරණයයි.

29. පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් සමාජයට එරෙහිව කරන ලද වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ බලපාන නීතය හඳුන්වන්නේ,
(1) අපරාධ නීතිය යනුවෙනි. (2) සිවිල් නීතිය යනුවෙනි.
(3) තේසවලාමෙයි නීතිය යනුවෙනි. (4) ඉස්ලාම් නීතිය යනුවෙනි.

30. නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ කවුරුන් ද?
(1) අග්‍රවිශ්වයකරුය. (2) අධිකරණ අමාත්‍යවරයාය.
(3) නීතිපතිය. (4) ජනාධිපතිය.

31. මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මිනිසත්බව ලැබීම හේතුකොට ගෙන පුද්ගලයෙකුට උපතින්ම ලැබෙන අයිතීන් මූලික අයිතිවාසිකම් වේ.

(2) සෑම මානව අයිතිවාසිකමක්ම මූලික අයිතිවාසිකම් වේ.

(3) සෑම මූලික අයිතිවාසිකමක්ම මානව අයිතිවාසිකම් වේ.

(4) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ දැක්වෙන්නේ මූලික අයිතිවාසිකම් වේ.

32. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මූලික අයිතිවාසිකම් කඩ වූ විටෙක ගත හැකි ක්‍රියාමාර්ග දක්වා ඇත්තේ,

(1) 126 වන වගන්තියේ ය. (2) 156 වන වගන්තියේ ය.

(3) 162 වන වගන්තියේ ය. (4) 165 වන වගන්තියේ ය.

33. ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය සම්මත කරන ලද්දේ කිනම් වර්ෂයකදී ද?

(1) 1991 දීය. (2) 1989 දීය. (3) 1924 දීය. (4) 1979 දීය.

34. ප්‍රසූත ආධාර ආඥා පනත, කාර්මික ආරවුල් පනත, සේවක අර්ථ සාධක අරමුදල් පනත වැනි අණ පනත් සම්මත කර ක්‍රියාත්මක කරන ලද්දේ කුමන ජන කොට්ඨාසයකගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා දැයි පහත පිළිතුරු වලින් තෝරන්න.

(1) ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා.

(2) ආදී වාසීන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා.

(3) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා.

(4) කම්කරු ජනතාවගේ අයිතීන් සුරැකීම සඳහා.

35. පාරිසරික ගැටලු ඇතිවීම සඳහා මුල්වල ප්‍රධානතම හේතුව වන්නේ,

(1) සම්පත් අධික ලෙස පරිභෝජනය කිරීමයි.

(2) ස්වභාවික පරිසරය විනාශ කිරීමයි.

(3) ජනගහන වර්ධනය විශාල ලෙස සිදුවීමයි.

(4) ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයේ සමතුලිතතාව බිඳ වැටීමයි.

36. පරිසරය ආරක්ෂා කිරීම සඳහා පුරවැසියන් විසින් ඉටු කළයුතු යුතුකමක් **නොවන** ප්‍රකාශය තෝරන්න.

(1) පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම.

(2) පරිසර නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම.

(3) පරිසර ප්‍රමිතීන් හඳුන්වා දීම.

(4) පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම.

- **පහත සඳහන් ප්‍රකාශ උපයෝගී කරගෙන 37 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.**

A - දේශපාලන අස්ථාවර බව.

B - ප්‍රාග්ධන සම්පත් වැඩි වීම.

C - ළදරු මරණ අනුපාතිකය අඩුවීම.

D - යැපෙන්නන්ගේ සංඛ්‍යාව ඉහළ මට්ටමක පැවතීම.

37. සංවර්ධිත රටවල දක්නට ලැබෙන ලක්ෂණ ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A හා C ය.

38. සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) ආයු අපේක්ෂාව පහළ මට්ටමක පැවතීම.

(2) මාතෘ මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීම.

(3) ළදරු මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීම.

(4) ඉහළ සාක්ෂරතා මට්ටමක් පැවතීම.

39. යුදමය අරමුණ පෙරදැරි කරගෙන පිහිටුවාගත් ප්‍රථම කලාපීය යුද සංවිධානය කුමක් ද?

(1) වොර්සෝ සංවිධානය. (2) සාර්ක් සංවිධානය.

(3) යුරෝපා සංවිධානය. (4) නේටෝ සංවිධානය

40. 1985 සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ සහභාගීත්වයෙන් සාර්ක් (SAARC) සංවිධානයේ අත්සන් තැබීමට රැස් වූ රට වන්නේ

(1) නේපාලයයි. (2) පාකිස්ථානයයි. (3) බංග්ලාදේශයයි. (4) මාලදිවයිනයි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය - II

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක්ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) (i) ප්‍රජාතාන්ත්‍රික සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මගින් ඉටුකළ යුතු කාර්යයන් 02 ක් ලියන්න.

(ii) වර්තමානයේ රාජ්‍ය සතු වන කාර්යයන් 02ක් ලියන්න.

(iii) බලයේ විවිධ ස්වරූප 02 ක් නම් කරන්න.

(iv) බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග 02 ක් ලියන්න.

(v) ආර්ථිකයක් තුළ සිදුවන ප්‍රධාන ක්‍රියාවලීන් 02 ක් ලියන්න.

(vi) ගැටුම් ඇතිවීමට බලපාන මූල 02 ක් ලියන්න.

(vii) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දැකිය හැකි ලක්ෂණ 02 ක් ලියන්න.

(viii) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන් ප්‍රධාන තේමා 03 ක් යටතේ දක්වා ඇත. ඉන් 02 ක් ලියන්න.

(ix) ජලය දූෂණය වීමෙන් ඇතිවන ගැටලු 02 ක් ලියන්න.

(x) ජාත්‍යන්තර සබඳතා වර්ධනය කරගැනීමට බලපාන සාධක 02 ක් ලියන්න.

(ලකුණු 10 × 2 =20)

(02) ''රාජ්‍යයේ හෝ ජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්ති වලට හැරවීමත් ඒවා ක්‍රියාවට නැංවීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ''

(i) ආණ්ඩුක්‍රම වල ස්වරූප 02 නම් කරන්න. (ල. 02)

(ii) රාජ්‍ය හා ආණ්ඩුව අතර ඇති වෙනස්කම් 03 ක් ලියන්න. (ල. 03)

(iii) a. ආණ්ඩුවේ ප්‍රධාන අවයව 03 නම් කරන්න. (ල. 03)

b. ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)

(03) ''පුද්ගල මනස තුළ ඇතිවන නොරිස්සුම්කාරී තත්වයක් මගින් ගැටුමක මූලාරම්භය සිදු වේ.''

(i) ගැටුම් ඇතිවන පාර්ශව 2 ක් නම් කරන්න. (ල. 02)

(ii) පුද්ගල මනස තුළ සාමය ඇතිකර ගැනීම සඳහා යොමුවිය හැකි අංශ 3 ක් ලියන්න. (ල. 03)

(iii) a. ගැටුම් නිරාකරණය සඳහා යොදා ගත හැකි ක්‍රමවේද 03 ක් නම් කරන්න. (ල. 03)

b. ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(04) ''සියලුම දෙනා නීතිය ඉදිරියේ සමාන විය යුතුය.''

(i) නීතියේ මූලාශ්‍ර 02 ක් ලියන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතියට අමතරව තවත් විශේෂ නීති වර්ග 03 ක් ක්‍රියාත්මක වේ. එම නීති වර්ග 03 නම් කරන්න. (ල. 03)

(iii) a. ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳව ඉහළම තලයේ සිටින නිල හෙවත් භූමිකා 03 නම් කරන්න. (ල. 03)

b. ඉන් එක් භූමිකාවක් පිළිබඳව විස්තර කරන්න. (ල. 02)

(05) ''මානව අයිතිවාසිකම් සුරකින ජන සමාජයක පුරවැසියන්ගේ සමාජ ජීවිතය වැඩි දියුණු වීම, හා සාධාරණත්වය වර්ධනය වීම සිදු වේ.

(i) මානව අයිතිවාසිකම් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 02)

(ii) කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 03 ක් ලියන්න. (ල. 03)

(iii) a. අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පනතට අයත් වන ලේඛන 03 ක් නම් කරන්න. (ල. 03)

b. ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)

(06) ''පරිසරය යනු ජීවීන් ගේ පැවැත්ම සඳහා බලපෑම් එල්ලකරන බාහිර තත්වයන්ගේ සංකලනයකි''

(i) පරිසර පද්ධතිය සකස් වී ඇති සංරචක 02ක් ලියන්න. (ල. 02)

(ii) පරිසරයෙන් ලැබෙන සේවාවන් 03 ක් ලියන්න. (ල. 03)

(iii) a. පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පුරවැසියන්ගේ යුතුකම් හා වගකීම් 03 ක් ලියන්න. (ල. 03)

b. ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)

(07) ''ජාත්‍යන්තර සබඳතා පැවැත්වීම තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු රැසකි.''

(i) ජාත්‍යන්තර සබඳතා පැවැත්වීමෙන් රටක් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන් අරමුණු 02 ක් ලියන්න. (ල. 02)

(ii) බලවත් රාජ්‍ය විසින් බලයෙන් අඩු රාජ්‍ය වෙත බලපෑම් එල්ලකරන ක්ෂේත්‍ර 03 ක් ලියන්න. (ල. 03)

(iii) a. රටක් ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන මාධ්‍ය 03 ක් ලියන්න. (ල. 03)

b. ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(2) | 3 -(2) | 4 -(1) | 5 -(3) | 6 -(4) | 7 -(2) | 8 -(1) | 9 -(3) | 10 -(4) |
| 11-(4) | 12-(1) | 13-(2) | 14-(2) | 15-(3) | 16-(4) | 17-(4) | 18-(1) | 19-(3) | 20-(2) |
| 21-(3) | 22-(2) | 23-(4) | 24-(1) | 25-(2) | 26-(3) | 27-(1) | 28-(4) | 29-(1) | 30-(3) |
| 31-(3) | 32-(1) | 33-(2) | 34-(4) | 35-(4) | 36-(3) | 37-(2) | 38-(4) | 39-(4) | 40-(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i)
* සත්‍ය හා නිවැරදි තොරතුරු සැපයීම.
* අපක්ෂපාතීව ජන සමාජයේ යහපැවැත්මට හිතකර අන්දමින් තොරතුරු සැපයීම.
* ජනතාවගේ දුක් ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම.
* පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු කිරීම.
* කාලීන තොරතුරු නිසි වේලාවට ජනතාවට ලබාදීම.

(ii)
* නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
* සමාජ සුබසාධක සේවා සැපයීම.
* සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.
* පොදු සේවා පවත්වාගෙන යාම.
* ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය පවත්වාගෙන යාම.
* දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කිරීම.
* අයිතිවාසිකම් ආරක්ෂා කිරීම......

(iii) පරිපාලනය බලය, දේශපාලන බලය, සමාජ බලය, අර්ථික බලය

(iv)
* එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනාගැනීම හා අවබෝධයෙන් කටයුතු කිරීම.
* එකිනෙකාට ගරු කිරීම, අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
* ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.
* සාමූහිකත්වය වර්ධනය කිරීම.
* සර්ව ආගමික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
* අන්‍ය මත ඉවසීම..... යනාදිය.

(v) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය

(vi) වාර්ගිකත්වය, දේශපාලනය, ආගමික මතවාද, සමාජ ආර්ථික තත්වය.

(vii)
* ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම.
* පුරවැසියන්ට නීතිය පිළිබඳ අවබෝධයක් තිබීම.
* සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම.
* නීතිය ඉදිරියේ සියළුමදෙනා සමාන වීම.
* විනිශ්චයකරුවන්ට බලපෑම් නොකිරීම.

(viii) පොදු මංමාවත්, මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා.

(ix)
* ජල චක්‍රයේ ක්‍රියාකාරීත්වයට බාධා ඇතිවීම.
* ජලජ ජීවීන් මියයාය, කෘෂිකාර්මික කටයුතු අඩාල වීම.
* පාරිසරික සුන්දරත්වය විනාශ වීම.
* දූෂිත ජලය පානය කිරීමෙන් ලෙඩරෝග හා වසංගත පැතිරීම.

(x)
* සම්පත් විසංතුලනය
* අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම.
* ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව.
* දියුණු තාක්ෂණය ලබා ගැනීමට.
* හදිසි ආපදා හා විපත් වලදී සහය ලබා ගැනීමට.
* තම අවශ්‍යතා සියල්ල තමන්ට නිපදවා ගත නොහැකි නිසා.
* දේශපාලන, සංස්කෘතික ආර්ථික, සාමාජික සබඳතා වැඩි දියුණු කර ගැනීමට.

(02) (i)
* පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හා ජනාධිපති ආණ්ඩු ක්‍රමය.

(ii)
* රාජ්‍ය ස්ථාවර වන අතර ආණ්ඩුව අස්ථාවරයි.
* ආණ්ඩුව කලින් කලට වෙනස් වන සුළුයි.
* රාජ්‍යයට ස්ථිර භූමියක් ඇති අතර ආණ්ඩුවට ස්ථිර භූමියක් නැත.
* රාජ්‍යයට ස්වාධිපත්‍ය බලය හිමිවන අතර එය ක්‍රියාවට නංවන්නේ ආණ්ඩුවයි.
* රාජ්‍ය ස්වාමියා වන අතර ආණ්ඩුව සේවකයා වේ.

(iii) a. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය.

b. විස්තර කිරීමට ආදළව ලකුණු ලබා දෙන්න.

(03) (i) පුද්ගලයා තුළ, පුද්ගලයින් අතර, ජන කණ්ඩායම් අතර, රටවල් අතර
(ii) ආගමික වතාවත් කෙරෙහි යොමුවීම, උපදේශනය ලබා ගැනීම, මනෝ විද්‍යාත්ම අභ්‍යාස මගින්, පරිසරය නිරීක්ෂණ කිරීම මගින්
(iii) a. සාකච්ඡා ක්‍රමය, සහමන්ත්‍රණය හා කේවල් කිරීම, මැදිහත්කරණය.
b. විස්තර කිරීමට ආදළව ලකුණු ලබා දෙන්න.

(04) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, විවිධ අණපනත්, අධිකරණ තීන්දු ආගම සිරිත් විරිත්, නීති විශාරදයින් ගේ මත හා විද්‍යාත්මක සිද්ධාන්ත.
(ii) උඩරට නීතිය, තේසවලාමේ නීතිය, මුස්ලිම් නීතිය
(iii) a. අධිකරණ අමාත්‍යතුමා, අග්‍රවිනිශ්චයකාරතුමා, නීතිපතිතුමා
b. විස්තර කිරීමට අදාළව ලකුණු ලබා දෙන්න.

(05) (i) * සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්.
* ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම්.

(ii) * කාන්තා ප්‍රඥාප්තිය සැකසීම.
* කාන්තා කටයුතු සම්බන්ධයෙන් වෙනම ආමාත්‍යාංශයක් පිහිටුවීම.
* ජාතික කාන්තා කමිටුව පිහිටුවීම.
* ගෘහස්ථ ප්‍රචණ්ඩත්සව පිළිබඳ පනත සම්මත කිරීම.
* අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටුවීම.
(iii) a. * එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය.
* ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය.
* සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබද අන්තර් ජාතික සම්මුතිය.
* සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පිත සම්මුතිය.
* ආර්ථික, සමාජයීය හා සංස්කෘතින අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇතිකළ වෛකල්පිත සම්මුතිය.
b. අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

(06) (i) අජෛවී සංරචක, ජෛව සංරචක, සමාජ පරිසරය, ස්වභාවික පරිසරය
(ii) ජීව උපකාරක සේවා / ආර්ථික උපකාරක සේවා / අපද්‍රව්‍ය අවශෝෂණ සේවා
(iii) a. * ජල සංචිත වියළී යාම, ගංවතුර හා නායයාම් ඇති වීම.
* ජීවීන්ගේ වාසස්ථාන අහිමිවීම.
* පරිසර සෞන්දර්යය පිරිහී යාම.
* ජෛව විවිධත්වය විනාශ වීම.
* ගෝලීය උණුසුම වැඩිවීම.
* භූගත ජල මට්ටම පහළයාම.
* කාන්තාරීකරණය වීම.
* ජල චක්‍රයේ ක්‍රියාකාරීත්වය බාධා ඇතිවීම...... යනාදිය.
b. අදාළ විස්තර කිරීමට ලකුණු ලබා දෙන්න.

(07) (i) * තම රටට සපුරා ගත නොහැකි දේ සපුරා ගැනීම.
* ප්‍රබල රාජ්‍යවලින් ඇතිවන බලතල වලින් ආරක්ෂාවීම සඳහා දේශපාලනික, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික සබඳතා පැවැත්වීම සඳහා.
* ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වලින් ඇතිවන බාධා මගහරවා ගැනිම සඳහා.
(ii) අන්තර්ජාතික වෙළඳාම / ණය හා ආධාර දීම / ආර්ථික සංවර්ධනය / ආරක්ෂක ක්ෂේත්‍රය / රැකියා සැපයීම.
(iii) a. තානාපති සේවය / ජාත්‍යන්තර වෙළඳාම / යුද්ධය / විදේශ ආධාර
b. අදාළ විස්තර කිරීමට ලකුණු ලබා දෙන්න.